**ජයබහළු පර්යන්ත සමාගම - 2015**

**-----------------------------------------**

ජයබහළු පර්යන්ත සමාගමේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය කරගෙන යාම සඳහා ප්‍රසිද්ධ වෘත්තියේ යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහය විය.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ජයබහළු පර්යන්ත සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| (i) 4.2.2 වගන්තිය | සෑම රාජ්‍ය ව්‍යාපාරයක් විසින්ම කාර්යසාධන ඇගයීම් කටයුතු සිදුකර කාර්යසාධන වාර්තා පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩලයේ ඇගයීම් සඳහා ඉදිරිපත් කළයුතු වුවත් සමාගම විසින් එවැනි කාර්යසාධන වාර්තා පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) 5.1.1 වගන්තිය | සෑම රාජ්‍ය ව්‍යාපාරයක් විසින්ම සංයුක්ත සැලැස්මක් (Corporate Plan) පිළියෙල කළයුතු වුවත් සමාගම එවැනි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. |
| (iii) 5.1.2 වගන්තිය | සෑම රාජ්‍ය ව්‍යාපාරයක් විසින්ම ක්‍රියාකාරී සැලැස්මක් (Action Plan) පිළියෙල කර ඊට අනුගත වැඩ විස්තරයක් ඉදිරිපත් කළයුතු වුවත් සමාගම එවැනි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. |
| (iv) 7.2 වගන්තිය | ආයතනයේ පාලන පරිසරයේ ප්‍රධාන අංගයක් ලෙස සියලු ප්‍රධාන මෙහෙයුම් ආවරණය වන පරිදි සකස් කරන ලද මෙහෙයුම් අත්පොතක් (Procedure Manual /System ) පිළියෙල කළ යුතු වුවත් සමාගම එවැනි මෙහෙයුම් අත්පොතක් සකස් කර නොතිබුණි. |

| | |
|---|---|
| (v) 7.4.1 වගන්තිය | විගණන කමිටුව රැස් වී අභ්‍යන්තර විගණනයෙන් සොයාගත් කරුණු මත පදනම්ව ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතිය හා මෙහෙයුම් කටයුතු වැඩි දියුණු කිරීමට අදාල නිර්දේශ ලබාදිය යුතු වුවත්, සමාගම අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබූ අතර, විගණන කමිටු රැස්වීම් ද පවත්වා නොතිබුණි. |
| (vi) 9.3.1 වගන්තිය | සෑම රාජ්‍ය ව්‍යාපාරයක් විසින් සෑම තනතුරක් සඳහාම විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක් (Schemes of Recruitment) සකසා ඊට රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය සහ පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබාගත යුතු වුවත්, සමාගමේ පවත්නා තනතුරු සඳහා චක්‍රලේඛ ප්‍රකාරව බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර ඊට අදාල පාර්ශවයන්ගේ අනුමැතීන් ලබාගෙන නොතිබුණි. |
| (ආ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 ඡේදය | එකතුකළ අගය මත බදු ගෙවීම පිළිබඳ මාසික වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ දී ගෙවන ලද එකතු කළ අගය මත බදු පිළිබඳ මාසික වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු.මිලියන 36.8 ක ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු.මිලියන 29.8ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 7 ක එනම් සියයට 23 ක වර්ධනයක් නිරීක්ෂණය විය.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ රු.56,653,921 ක්ව පැවති ලාභය ඉන් පසු වර්ෂවලදී උච්චාවචනය වී තිබුණු අතර 2015 වර්ෂය අවසානය වනවිට රු.36,805,921 ක් දක්වා අඩුවී තිබුණි. සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය සැලකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයේ රු.195,496,703 ක්ව පැවති ආයතනයේ දායකත්වය උච්චාවචනයන්ට ලක්වී තිබූ අතර 2015 වර්ෂය අවසන් වනවිට රු.169,783,722 ක්වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

වරාය අධිකාරියේ විෂය භාර අමාත්‍යවරයා විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත ලබා දෙන උපදෙස් අනුව වරාය අධිකාරිය විසින් සමාගම වෙත කලින් කලට පවරනු ලබන කාර්යයන් සහ කර්තව්‍යයන් හා නියමයන් පරිදි, ජයබඹළු පර්යන්තයේ මෙහෙයුම් හා කළමනාකාරීත්වය පවත්වාගෙන යාම සමාගමේ ප්‍රධාන අරමුණ ලෙස දැක්වේ. ඒ අනුව ජයබඹළු පර්යන්තයේ කාර්යසාධනය පහත දැක්වේ.

| වර්ෂය | පැටවුම් නැව් තෙල් වර්ගය | | | ගොඩබෑම් නැව් තෙල් වර්ගය | | |
|---|---|---|---|---|---|---|
| | අයිඑෆ්ඕ 180 මෙ.ටොන් | එච්එෆ්ඕ 380 මෙ.ටොන් | මැරයින් ගෑස්ඔයිල් මෙ.ටොන් | අයිඑෆ්ඕ 180 මෙ.ටොන් | එච්එෆ්ඕ 380 මෙ.ටොන් | නාවික ගෑස්තෙල් මෙ.ටොන් |
| 2015 | 38,172 | 347,143 | 50,714 | 36,377 | 338,750 | 50,274 |
| 2014 | 46,083 | 226,153 | 61,402 | 48,131 | 243,460 | 61,997 |
| 2013 | 31,817 | 185,377 | 54,450 | 31,147 | 179,001 | 44,975 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේ දී අයිඑෆ්ඕ (IFO 180) වර්ගයේ තෙල් පැටවුම් (Lording) සියයට 17 කින් ද නාවික ගෑස් තෙල් (Marine Gas Oil) වර්ගයේ තෙල් පැටවුම් සියයට 17 කින් ද අඩු වී තිබුණි.

(ආ) 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේ දී අයිඑෆ්ඕ(IFO 180) වර්ගයේ තෙල් බෑම් සියයට 24 කින් ද නාවික ගෑස් තෙල් (Marine Gas Oil) වර්ගයේ තෙල් බෑම් සියයට 19 කින් ද අඩු වී තිබුණි.

4.2 **කාර්ය මණ්ඩල පරිපාලනය**

ආයතනයේ සංවිධාන ව්‍යුහය අනුව අනුමත කාර්ය මණ්ඩලය නිලධාරීන් 65 දෙනෙකුගෙන් සමන්විත වුවත්, 2015 දෙසැම්බර් 31 දිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 89 දෙනෙකු වූයෙන් කාර්ය මණ්ඩලයේ 24 ක අතිරික්තයක් පැවතුණි. එසේම සංවිධාන ව්‍යුහය සඳහා රේඛීය අමාත්‍යාංශයේ හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතියද ලබාගෙන නොතිබුණි.

5. **පද්ධති හා පාලනයන්**

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු විය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | කාර්ය මණ්ඩල පරිපාලනය | බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කර නොගැනීම. |
| (ආ) | අභ්‍යන්තර විගණනය | අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවීමට කටයුතු නොකිරීම සහ විගණන වැඩසටහනක් අනුව අභ්‍යන්තර විගණනයක් සිදු නොවීම. |